ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ශ්‍රී ලංකාවේ ජලජීවී වගාකරුවන් ඉන්දියාවේ **ICAR - CIFA** හි විශේෂ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනකට සහභාගී වේ</u>

ශ්‍රී ලංකාවේ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ජලජීවී වගාකරුවන් 10 දෙනෙකු සඳහා විශේෂ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් 2026 පෙබරවාරි 02 සිට 13 දක්වා මිරිදිය ජලජීවී වගාව සඳහා ඉන්දියාවේ ප්‍රමුඛතම පර්යේෂණ ආයතනය වන භුබනේශ්වර් හි මිරිදිය ජලජීවී වගාව සඳහා මධ්‍යම ආයතනයේදී (CIFA) පැවැත්විණ. මෙම ආයතනය කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ඉන්දියානු කවුන්සිලය (ICRA) යටතේ පවතී.

2. මත්ස්‍යය සහ පද්ධති විවිධාංගිකරණය, මව්පිය මත්ස්‍ය තොග කළමනාකරණය, මත්ස්‍ය බිත්තර සුරැකීම සහ අභිජනනය, මත්ස්‍ය තවාන් කළමනාකරණය සහ කුඩා මත්ස්‍යයය පැටවු සම්බන්ධයනේ සැලකිලිමත් විය යුතු කරුණු, ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරන සහ පිරිවැය අවම කරන නවීන තාක්ෂණික විධි ක්‍රම, ජලජීවී වගාවේදී ප්ලාස්ටික් භාවිතය, මත්ස්‍යයන්ගේ නිරෝගීභාවය පවත්වාගෙන යාම, ජලජීවී වගා ක්ෂේත්‍ර පාසල සහ වගාකරුවන් අතර දැනුම හුවමාරු කරගැනීම යනාදි තේමාවන් යටතේ තාක්ෂණ සැසි වැඩසටහනට ඇතුළත් විය. ශ්‍රී ලංකා කණ්ඩායම සඳහා ස්මාර්ට් පොකුණු ඒකක, බයෝෆ්ලොක් (biofloc) පහසුකම්, මිරිදිය ඉස්සන් ඒකක, විසිතුරු මත්ස්‍ය ඒකක, වායුගෝලයේ වාතය ආශ්වාස කරන මත්ස්‍ය ඒකක සහ අභිජනන පහසුකම් ඇතුළු CIFA හි ප්‍රධාන ගොවිපළ සහ පර්යේෂණාගාර වෙත සංචාර ද සංවිධානය කර තිබිණ.

3. වැඩසටහන සාර්ථකව අවසන් කර ශ්‍රී ලංකාවට පැමිණි පිරිස සිය අත්දැකීම් බෙදා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මැතිතුමා හමු විය. මෙම අවස්ථාව සඳහා ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය බී. කේ. කෝලිත කමල් ජිනදාස සහ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපති කිත්සිරි ධර්මප්‍රිය යන මහත්වරු ද සහභාගී වූහ. මෙම අවස්ථාව

අමතමින්, මහ කොමසාරිස්තුමා දෙරට අතර සංවර්ධන සහයෝගිතාවයේ වැදගත් කුළුනක් වන ධාරිතා සංවර්ධන ක්ෂේත්‍රය තුළ වර්ධනය වන හවුල්කාරිත්වය අවධාරණය කළේය. ඉහළ නංවන ලද ඉන්දියාවේ ධාරිතා සංවර්ධන වැඩසටහන් තුළින් මේ වන විට වාර්ෂිකව වෘත්තිකයන් සහ රජයේ සේවකයන් 1000 දෙනෙකු සඳහා පුහුණු අවස්ථා හිමි වේ. මෙම පුහුණු අවස්ථාවන් පිරිනමනු ලබන්නේ, ඉන්දීය තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතා වැඩසටහන වැනි දැනට ක්‍රියාත්මක යෝජනාක්‍රම යටතේ ලබා දෙන පුහුණු අවස්ථාවන්ට අමතරව වීම විශේෂත්වයකි.

*****

**කොළඹ**

***2026*** *පෙබරවාරි* ***16***